**“ කාන්තා දේශපාලනයේ පරිනාමය ” පිළිබඳ පොතක් නිර්මාණය කිරීම.**

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ජාතික කාන්තා කමිටු සභාපතිනිය වන ස්වර්ණා සුමනසේකර මහත්මිය විසින් 2007 වර්ෂයේ රචනා කරන ලද “කාන්තාවන් දේශපාලනයට සහභාගි විය යුත්තේ ඇයි? ” යන පොත් පිංච යාවත්කාලීන කිරීමේ කාලීන අවශ්‍යතාවය මත ”කාන්තා දේශපාලනයේ පරිනාමය” යන්නෙන් නව පුස්තකයක් රචනා කර එළිදැක්වීමට තීරණය කරන ලදී.

කාන්තා දේශපාලන සහභාගිත්වය පිළිබඳ ඓතිහාසික විකාශනය, වර්ථමාන තත්ත්වය හා ඉදිරිමඟ පැහැදිලි කෙරෙන මෙම පුස්තකය ජාතික කාන්තා කමිටුවේ ක්‍රියාකාරී සැලැස්මට අන්තර්ගත වූයෙකි. දේශපාලනයට සහභාගිවීමට අපේක්ෂිත කාන්තාවන් සඳහා, දේශපාලනයේ නිරත කාන්තාවන් සඳහා හා කාන්තා දේශපාලනයේ පරිනාමය පිළිබඳව දැනුවත් වීම අපේෂා කරන කාන්තා සඳහා මෙම පොත් පිළිගැන්වීමට අපේක්ෂිතය.

සිංහල භාෂාවෙන් රචිත මෙම ග්‍රන්ථයෙන් කාන්තා දේශපාලන ක්ෂේත්‍රයට අදාල විස්තර මෙහි සාරාංශගතව ඇති අතර ඇතැම් කරුණු සම්බන්ධයෙන් විශ්ලේෂණාත්මක විස්තරයක් ඇතුලත් කිරීමට කතුවරිය උත්සහ ගෙන තිබේ. කාන්තා දේශපාලනයේ ඉතිහාසය, කාන්තා දේශපාලන සහභාගිත්වයේ වර්තමානය, කාන්තාවන් දේශපාලනයට සහභාගි විය යුත්තේ ඇයි? ද යන්නත්, කාන්තාවනට එරෙහි මැතිවරණ ප්‍රචණ්ඩත්වය හා ඉදිරිමඟ යන මාර්තෘකා ඔස්සේ කරුණු ගෙනහැර පාමින් කතුවරිය ග්‍රන්ථය පුරා පඨකයන්ගේ මනසට ආමණ්ත්‍රනය කරයි.

ජාතික කාන්තා කමිටුව විසින්, දේශපාලනයට අවතීර්ණය වන්නට අපේක්ෂිත කාන්තාවන් සඳහාත්, දේශපාලනය පිළිබඳ ප්‍රජා වැඩසටහන්වලට සහභාගිවන කාන්තාවනටද, ජාතික කාන්තා කමිටුවට හා භාහිර ආයතන සඳහාත් , විශ්ව විද්‍යාල සිසුන් හා ප්‍රාදේශිය ලෙකම් කාර්යාල සඳහාද, පළාත් පාලන අමාත්‍යාංශයේ පුහුණු ආයතනයන්ට හා එම ආයතනවල පුස්තකාල සඳහා මෙම ග්‍රන්ථය පරිශීලන සඳහා බෙදා හැරීමට නියමිතව ඇත.